5. 3 වන නියෝගයේ විධිවිධාන ක්‍රියාත්මක කරමින් නියම බලධරයා විසින් කෘෂිකාර්මික සන්තකය ලබා ගන්නා ලද අවස්ථාවක—

(අ) ඉඩම වගා කරවීමේ කාර්යය සඳහා එම ඉඩමේ සන්තකය එසේ ලබා ගෙන ඇති බවට තම අත්සන යටතේ වූ ලියවිල්ලකින් වූ සහතිකයක් ඔහු විසින් නිකුත් කොට එම ඉඩමේ අයිතිකරු හෝ පරිහරණය කරන්නා වෙත එම සහතිකය භාර දිය යුතුය ; නැතහොත් එම ඉඩමේ පැහැදිලිව පෙනෙන ස්ථානයක එය ප්‍රදර්ශනය කරවිය යුතුය.

(ආ) (i) තමා සුදුසු යැයි සලකන තැනැත්තකු හෝ තැනැත්තන් ලවා, සිය අභිමතය පරිදි නිශ්චය කරනු ලැබිය හැකි කාලයක් තුළ ඔහු විසින් ඒ ඉඩම වගා කරවිය හැකිය ; තවද

(ii) ඉඩම නිසි ලෙස සහ විධිමත්ව වගා කෙරෙන බවට වගබලා ගැනීම පිණිස පැනවීම අවශ්‍ය යැයි නියම බලධරයා අදහස් කරන නියමයන්ට සහ කොන්දේසිවලට අනුකූලව ක්‍රියා කරන බවට නියම බලධරයා සෑහීමට පත්වන පොරොන්දුවකට අයිතිකරු හෝ පරිහරණය කරන්නා ඇතුළත් වන විටෙක දී, ඉඩමෙහි සන්තකය අයිතිකරුට හෝ කලින් සිටි පරිහරණය කරන්නාට දිය හැකිය.

6. මේ නියෝගවල ඉහත දක්වුනු විධිවිධාන යටතේ ලියා අත්සන් කරන ලද සෑම ලිඛිත පොරොන්දුවක්—

(අ) මුද්දර ගාස්තුවෙන් නිදහස් විය යුතුය; තවද,

(ආ) එය සාක්ෂිකරුවන් දෙදෙනකු හෝ ඊට වැඩි දෙනකු ඉදිරිපිට දී අත්සන් නොකරන ලද්දේ වුව ද, එය ලියා අත්සන් කිරීම බලයලත් ප්‍රසිද්ධ නොතාරිස් කෙනකු විසින් සහතික නොකරන ලද්දේ වුව ද වලංගුව කාර්ය සාධක විය යුතුය.

ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත අදාළ කිරීමේ කාර්යය සඳහා එවැනි සෑම ලිඛිත පොරොන්දුවක් ම එකී පොරොන්දුව අදාළ වන ඉඩමට බලපාන සාධන පත්‍රයක් ලෙස සලකනු ලැබිය යුතු අතර නියම බලධරයා විසින් හෝ ඒ වෙනුවෙන් නියම බලධරයා විසින් බලය පවරන ලද යම් තැනැත්තකු විසින්, ලියාපදිංචි කිරීම සඳහා එය ඉදිරිපත් කරනු ලැබිය හැකිය :

එසේ වුව ද, ඒ ආඥාපනතේ කුමක් සඳහන් වුවද, එකී යම් පොරොන්දුවක් ලියාපදිංචි කිරීම සඳහා හෝ සම්බන්ධයෙන් ඒ ආඥාපනත යටතේ කිසිම ගාස්තුවක් නොගෙවිය යුතුය.

7. නියම බලධරයාගේ බලප්‍රදේශය ඇතුළත පිහිටි යම් කෘෂිකාර්මික ඉඩමකට ඇතුල් වී එය පරීක්ෂා කිරීමට නියම බලධරයාට හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලබන යම් තැනැත්තකුට හෝ බලය තිබේ.

8. මේ නියෝගවල විධිවිධාන යටතේ තමා වෙත නියම බලධරයා විසින් නිකුත් කරනු ලබන සියලු උපදෙස් ක්‍රියාත්මක කිරීම, එම ඉඩම පිහිටා ඇත්තේ යම් පොලිස් ස්ථානයක් භාර නිලධරයකුගේ බලප්‍රදේශය තුළ ද ඒ පොලිස් නිලධරයාගේ හා ඔහුගේ බලය ලත් නියෝජිතයාගේ යුතුකම විය යුතුය.

9. යම් තැනැත්තකු මේ නියෝග අතුරින් යම් කිසිවක් කඩ කරන හෝ ඒ අනුව ක්‍රියා කිරීම පැහැර හරින අවස්ථාවක ඔහු වරදක් කරන්නේ ය. ඒ සම්බන්ධයෙන් මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් පන්සියයකට නොඅඩු සහ රුපියල් පන්දහසකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතුය.

10. මේ නියෝගවල—

" කෘෂිකාර්මික ඉඩම " යන්නෙන් මේ නියෝගවල අර්ථානුකූලව කෘෂිකර්මය සඳහා පාවිච්චි කරනු ලබන හෝ පාවිච්චි කළ හැකි ඉඩමක් අදහස් වේ .

" කෘෂිකර්මය " යන්න ට—

(1) වී, සියලු කෙත් බෝග, කුළුබඩු, කාර්මික බෝග, එළවළු, පළතුරු, මල්, ගෝචර බිම් හා සත්වාහාර සහ මෙහි උපලේඛනයෙහි සඳහන් ආහාර බෝග වගා කිරීම,

(2) කිරි පට්ටි පාලනය, සතුන් ඇති කිරීම හා බෝ කිරීම;

(3) පැල හා පළතුරු තවාන්,

යන මේවා ඇතුළත් වේ.

" නියම බලධරයා " යන්නෙන් එම ඉඩම පිහිටියා වූ පරිපාලන දිස්ත්‍රික්කයේ දිසාපති හෝ ඔහු විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද යම් තැනැත්තෙක් අදහස් වේ.

" පරිහරණය කරන්නා " යන්නෙන් යම් කෘෂිකාර්මික ඉඩමක් පාවිච්චි කරන හෝ එය සන්තකව සිටින යම් තැනැත්තකු අදහස් වන අතර—

(අ) බදු ගැනුම්කරුවී හෝ පොලිමරා උකස්හිමිවී සිටීමේ බලය ප්‍රකාර යම් කෘෂිකාර්මික ඉඩමක් පාවිච්චි කිරීමට හෝ පරිහරණය කිරීමට තත් කාලයේ හිමිකම් ඇති තැනැත්තෙක් , සහ

(ආ) ඉඩම් සංවර්ධන ආඥාපනත, රජයේ ඉඩම් ආඥාපනත හෝ වෙන යම් ප්‍රඥප්තියක් යටතේ හෝ අන්සතු කරන ලද කෘෂිකාර්මික ඉඩම් පාවිච්චි කරන සහ පරිහරණය කරන යම් තැනැත්තෙක්,

එයට ඇතුළත් වේ.

" අයිතිකරු " යන්නට හවුල් අයිතිකරුවෙක් ඇතුළත් වේ.

" තැනැත්තා " යන්නට සංස්ථාගත කරන ලද හෝ සංස්ථාගත නොකරන ලද කවර පුද්ගල මණ්ඩලයක් වුව ද ඇතුළත් වේ.

" අඩුවෙන් වගා කළ කෘෂිකාර්මික ඉඩම " යන්නෙන්, නියම බලධරයාගේ මතය අනුව උපලේඛනයෙහි නිශ්චිතව සඳහන් බෝග වර්ග වගා කිරීමේ පුළුවන්කම අනුව සලකා බලන කල ප්‍රමාණවත් නොවූ වගාවක් කර ඇති ඉඩමක් අදහස් වේ.

උපලේඛනය

| | | |
|---|---|---|
| වී | ලූනු | සෝගම් |
| මයිඤෝක්කා | කව් පි | සෝයා බෝංචි |
| බතල | තෝර පරිප්පු | කහ |
| වැල් අල | කුරක්කන් | තල |
| ගහල වර්ග | රටකජු | කෙසෙල් |
| අල වර්ග | මුං ඇට | මිලට් |
| මිරිස් | ඉරිඟු | උඳු |

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී